# ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය

# සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

# පුරප්පාඩු

## පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ

**අධ්‍යක්ෂ (HM 1-1) – 01**

(අ) **අධ්‍යාපන සුදුසුකම්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සමග කළමනාකරණ ක්ෂේත්‍රයේ විද්‍යාපති / ශාස්ත්‍රපති උපාධියක් හෝ පිළිගත් වෘත්තිය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වයක් ලබා තිබීම.

**සහ**

**පළපුරුද්ද**

උපාධි සුදුසුකම් ලබාගැනීමෙන් පසුව රජයේ හෝ රාජ්‍ය ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 15 ක පළපුරුද්දක්

**හෝ**

(ආ) අවම වශයෙන් යුධ හමුදාවේ දැනට සේවයේ නියුතු හෝ විශ්‍රාමික ස්ථිර බලකායේ ලුතිනන් කර්නල් වරයෙකු හෝ ඒ හා සමාන නිලයක සේවයේ නියුතු හෝ විශ්‍රාමික නාවික හෝ ගුවන් හමුදාවේ හෝ ශ්‍රී ලංකා පොලිසියේ නිලධාරියෙක් වීම හෝ ඊට ඉහළ නිලයක නිලධාරියෙකු වීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

01. "කළමනාකාර" සේවා ශ්‍රේණියෙහි 1 වන ශ්‍රේණියෙහි අවම වශයෙන් වසර 05ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය හා කාණ්ඩය** : HM 1-1-රු: (80,295- 15 X 2,270-114,345)

**වයස් සීමාව**: අවුරුදු 35ට නොඅඩු විය යුතු අතර, 55ට නොවැඩිය විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**පොදු කොන්දේසි**

- ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.
- දැනට රජයේ සේවයේ නියුක්ත වූ අයදුම්කරුවන් හට ඉහත උපරිම වයස් සීමාව අදාළ නොවේ.
- අයදුම්පත් 2024.02.02 දිනට හෝ ඊට පෙර සහතිකවල සහතික කරන ලද පිටපත් ද සහිතව පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුයි.
- අභ්‍යන්තර අයදුම්කරුවන් හා දැනට රාජ්‍ය සේවයේ නියුක්ත වූවන් ආයතන ප්‍රධානීගේ නිර්දේශය සහිතව අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීමට කටයුතු කරන්න.

**සැයු :** ඉහත තනතුර සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන් තෝරාගනු ලබන්නේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත බඳවා ගැනීම් පටිපාටියේ විධි විධානවලට අනුකූලවයි.

**සභාපති,**
**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය,**
**තැ පෙ 2211, ආතර් ද සිල්වා මාවත,**
**කොළඹ 13.**